# වකුගඩු රෝග නිවාරණ වැඩසටහන **කෘෂි රසායන සමාගම්වලට**

# පාවා නොදෙනු!



වකුගඩු රෝග නිවාරණ ජනාධිපති කාර්ය සාධන බලකාය විසින් "වකුගඩු රෝග නිවාරණ පාර්ශවකරුවන්ගේ මෙහෙයුම් එළිදැක්වීම" නමින් ජාතික වැඩමුළුවක් 2015 දෙසැම්බර් 16 දින ගාලු මුවදොර හෝටලයේ දී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. මෙම වැඩමුලුවේ මූලික අරමුණ ලෙස සඳහන්ව ඇත්තේ වකුගඩු රෝග නිවාරණයට අදාලව විවිධ පර්යේෂණයන්හි ප්‍රතිඵල හා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන විසින් වකුගඩු රෝගය නිවාරණය කිරීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් පිළිබඳ සමාලෝචනයක් සිදු කර ඉදිරි ජාතික සැළසුමක් සකස් කිරීමයි.

විශේෂයෙන් වකුගඩු රෝගය පිළිබඳ දීර්ඝ කාලයක් ගොවීන් සමග කටයුතු කල විවිධ කණ්ඩායම් ඇතුලු සිවිල් සමාජ සංවිධාන නොසලකා හරිමින් මෙම වැඩමුළුව පැවැත්වීම පිළිබඳව අපගේ විරෝධය ඉදිරිපත් කරන අතර, මෙවැනි ජාතික වැදගත්කමකින් යුත් ක්‍රියාකාරීත්වයක් දියත් කිරීමේ දී ගොවි ජනතාවගේ අදහස් හා යෝජනා ලබා ගැනීම අත්‍යාවශ්‍ය වන බව අපි අවධාරණය කරමු.

අප දන්නා පරිදි වර්තමාණයේ නිර්මාණය වෙමින් පවතින විකල්ප කෘෂිකර්මයක් පිළිබද ජාතික සංවාදය ආපස්සට හැරවීමට බහු ජාතික කෘෂි සමාගම්වල දේශීය අලෙවි නියෝජිතයන් හා ඔවුන්ගේ මුදල් මත යැපෙන විවිධ විද්වතුන් යයි කියාගත් පිරිස් මේ වන විටත් විශාල උත්සහායක් ගනිමින් සිටිති. උදාහරණයක් ලෙස, මෙම පිරිස් සතුව ඇති අතිවිශාල මුදල් සම්භාරයන් මාධ්‍ය ආයතන, පර්යේෂකයන්, දේශපාලකයන් හා ගොවි කණ්ඩායම් වෙත විවිධාකරයෙන් මුදා හරමින් මේ වන විට ශ්‍රී ලංකාවේ තහනම් කර ඇති ග්ලයිපොසේට් වල් නාශකයේ තහනම ඉවත් කර ගැනීමට දැඩි උත්සාහයක් ගනිමින් සිටිති. එමෙන්ම පසුගිය දිනවල සී.අයි.සී සමාගම විසින් ගෙන්වා රජය විසින් තහනම් කරන ලද කැඩ්මියන් අධික පොහොර නිදහස් කර ගැනීමටද ඒ ආකාරයේම උත්සහායන් පවතී.

එලෙසම ආසනික් සහිත කෘෂි රසායන තහනම් කළ විට ඒවාට ද විද්‍යාත්මක පදනමක් නොමැති බව ද, තව ද වකුගඩු රෝග කාරකයක් වන කෘෂි රසායනික හා රසායනික පොහොර පිළිබඳ දර්ශණය තවදුරටත් වපුරමින් ඒවා මෙම රෝගයට කිසිසේත් සම්බන්ධ නොවන බව තර්ක කරමින්, එහි ඇති වෛද්‍ය විද්‍යාත්මක කාරණා වලට ද අභියෝග කරයි. එලෙසින් ම මෙකී ආචාර්ය මහාචාර්යවරු ප්‍රසිද්ධ පුවත්පත් හා මාධ්‍යයන් වෙත ද මෙම මතය පතුරුවා හරිමින් මහජන මතය හා ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ මතය ද වෙනස් කිරීමට මිලියන ගණනින් වියදම් කරනු ලබයි. පුවත්පතේ දැන්වීම් පළකරමින් 'ක්‍රොප් ලයිෆ් එකතුව' ලෙස රසායනික පොහොර හා පලිබෝධනාශක සමාගම් උපරිම ලෙස තම සේවය ලබාදෙයි. සමාගම් වලට වැදුණු මරු පහරක් වු ග්ලයිපෝසෙට් තහනම ඉවත් කරගැනීම සඳහා ජනාධිපතිවරයාට විවිධ කරුණු පෙන්වාදෙමින් විශේෂඥමතයක් නොමැතිව මෙවැනි තහනමක් ලෝකයේ කොතනකවත් සිදුකර නොමැති බව කියමින් මෙම තහනම පිළිබඳ විද්‍යාත්මක පසුබිමක් නොමැති බව පෙන්වා දීම සඳහා ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක විවිධ පර්යේෂණ ආයතන හා පර්යේෂකයන්ට යහමින් මිල මුදල් ලබාදෙමින් ඊනියා උගතුන් මේ සඳහා සම්බන්ධ කරගැනීමට මේ වනවිට කටයුතු කරමින් සිටී.

මේ නිසා විශාල අර්බුධයක් බවට පත්ව ඇති වකුගඩු රෝගය ඇතිවීම සහ පැතිරවීම සඳහා වග කිව යුතු කෘෂි සමාගම් සහ ඔවුන්ගේ මුදල් වලට යටවී සිටින ඊනියා විද්වතුන් යැයි කියා ගත් පිරිස් වකුගඩු රෝග නිවාරණය සඳහා වන ජාතික වැඩපිළිවෙලක් ගොඩ නැගීම සඳහා සම්බන්ධ කර නොගත යුතු යැයි අප අවධාරණය කර සිටිමු.

එසේම, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා "මෛත්‍රී පාලනයක්, ස්ථාවර රටක්" ප්‍රතිපත්ති ප්‍රකාශයේ ද සඳහන් කර ඇති පරිදි, මෙරට ජනතාවගේ ආහාර ස්වෛරීභාවය තහවුරු කරන්නට පොරොන්දු වී ඇත. ඒ අනුව, වකුගඩු රෝග නිවාරණ ජනාධිපති කාර්ය සාධන බලකාය ආරම්භ කිරීමේ පුරෝගාමියා ලෙස, ඇති වී තිබෙන ගැටලුවලට තිරසාර විසඳුමක් සඳහා පහත සදහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන ලෙස අපි එතුමාගෙන් ඉල්ලා සිටිමු.

1. **වකුගඩු රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා පළාතේ සියලුම රජයේ රෝහල්වලට අවශ්‍ය පහසුකම් නොපමාව සැපයීම.**

2. **රෝගය දරුණු ලෙස ව්‍යාප්තව පවතින ප්‍රදේශවල ජනතාවට අවශ්‍ය පිරිසිදු පානීය ජලය නොමිලයේ සැපයීමට අවශ්‍ය පියවර ගැනීම.**

3. **වකුගඩු රෝගයට ගොදුරුව සිටින හා මියගිය පුද්ගලයින්ගේ පවුල්වලට ප්‍රමාණවත් සහණාධාර මුදලක් මාස්පතා ලබා දීමට කටයුතු කිරීම.**

4. **වකුගඩු රෝගයට අදාලව හෙළිදරව් වූ ග්ලයිපෝසෙට් ඇතුලු සියලු කෘෂි රසායනික ආනයනය තහනම් කිරීම හා මේ වන විට වෙළෙඳ පොළෙහි ඇති තොග වහාම ඉවත් කිරීම.**

5. **ලෝකය පුරා වකුගඩු රෝග පිළිබඳ කර ඇති පර්යේෂණ ගැන සොයා බැලීම සහ විද්‍යාත්මක පිළිගත් පර්යේෂණ සිදු කිරීමට රජය මැදිහත් වීම.**

6. **ලෝක සෞඛ්‍ය සංවිධානය හා දේශීය පර්යේෂකයන් විසින් රජයට ලබා දී ඇති යෝජනා ක්‍රියාත්මක කිරීම.**

7. **විවිධ බොරු ප්‍රචාරයන් හරහා සිදුකරන ජල පෙරණ විකිණීම වහාම නතර කිරීම.**

8. **කෘෂි සමාගම්වල සම්බන්ධතාවයන් ඇති පර්යේෂකයින් විසින් ඉදිරිපත් කරන නිර්දේශ පිළිබඳ අවධානය යොමු නොකිරීම.**

9. **සුළු පරිමාණ ආහාර නිෂ්පාදකයින්ට ඉඩම්, ජලය, හා අනෙකුත් ස්වාභාවික සම්පත් සඳහා ඇති අයිතිය තහවුරු කිරීම, ඒ පිළිබද තීන්දු තීරණ ගැනීමේදී ඔවුන්ගේ සෘජු දායකත්වය ලබා ගත යුතු අතර තිරසර භාවිතය තහවුරු වන ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම.**

10. **රසායනික පොහොර සහනාධාරය වෙනුවෙන් වෙන්කරන මුදල පරිසර හිතකාමී ගොවිතැන ව්‍යාප්ත කිරීම සදහා අවශ්‍ය පර්යේෂණ, ව්‍යාප්ති කටයුතු හා ගොවින් දිරිගැන්වීමේ වැඩපිලිවෙලක් සඳහා යෙදවීම.**

11. **රසායනික ගොවිතැනෙන් රට නිදහස් කර ගැනීම සඳහා සොබාදහමට එකඟ, දේශීය සම්පත් මත පදනම් වූ තිරසර කෘෂිකාර්මික ප්‍රතිපත්තියක් ගොඩනැගීම.**


**වස විස විරෝධී ජාතික ව්‍යාපාරය**

නො 185/2/1, කොස්වත්ත, තලංගම උතුර

දුරකතන 011-2791912